# නැගෙනහිර ඡන්දය හා මුස්ලිම් කලාපය

පසුගිය දිනෙක රැස්වූ සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ එකඟතාවෙන් උතුරු හා නැගෙනහිර පළාත් එක්කිරීමටත් වෙන ම මුස්ලිම් කලාපයක් ඇතිකිරීමටත් යෝජනා කිරීමට තීරණයකෙරී ඇති බව වාර්තා වෙයි. වාර්තාවලට අනුව මේ යෝජනාවේ මූලිකත්වය ගෙන ඇත්තේ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය ය. එයට ලංකා සමසමාජ පක්ෂයේ ද කොමියුනිස්ට් පක්ෂයේ ද සහාය ලැබී ඇත. මුස්ලිම් කොංග්‍රසය හැරෙන්නට අනෙක් මුස්ලිම් පක්ෂ ද ඒ සඳහා එකඟ වූ බව කියැවෙයි. එහෙත් ඒ පක්ෂ ඒ සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාකරන්නේ ද යන්න පැහැදිලි නැත. ඒ ඇතැම් පක්ෂ සර්ව පාක්ෂික නියෝජිත කමිටුවට කලින් ප්‍රකාශකර තිබුණේ උතුරු හා නැගෙනහිර පළාත් එක්කරන්නේ නම් පමණක් මුස්ලිම් කලාපයක් දිය යුතු බව ය.

දැනට මහජන එක්සත් පෙරමුණ හා ජාතික හෙළ උරුමය සර්ව පාක්ෂික නියෝජිත කමිටුවට සහභාගි නො වෙයි. උඑරු හා නැගෙනහිර පළාත් එක්කිරීමකට මහජන එක්සත් පෙරමුණ තදින් ම විරුද්ධ වන අතර ඒ සම්බන්ධයෙන් කමිටුව ගෙන ඇති තීරණය මුළුමනින් ම ප්‍රතික්ෂෙපකරයි. වෙනත් අයුරකින් කියන්නේ නම් ඒ යෝජනාව අඩංගු වූ වාර්තාවකට ම එ පෙ අත්සන් නොකරනු ඇත. මේ යෝජනාව එක් පැත්තකින් මුස්ලිම් කොංග්‍රසයේ, බෙලහින සමසමාජ පක්ෂයේ හා කොමියුනිස්ට් පක්ෂයේ සිංහල විරෝධී වුවමනා ඉටුකර ගැනීම සඳහා ද අනෙක් පැත්තෙන් නැගෙනහිර පළාත් සභා මැතිවරණයේ දී මුස්ලිම් කොංග්‍රසයට මුස්ලිම් ජනයාගේ ඡන්ද ලැබේ යැයි සිතමින් ද ඉදිරිපත්කරන ලද්දකි.

අධිරාජ්‍යවාදයට එරෙහිව කටින් බතල කොළ හිටවන කසිකනල් මාක්ස්වාදී පක්ෂ අද ව්‍යවහාරිකව අධිරාජ්‍යවාදී වුවමනා වෙනුවෙන් පෙනී සිටියි. අද ඇතැම් මාක්ස්වාදී පක්ෂ නඩත්තුකෙරෙනුයේ ද බටහිරයන් විසිනි. අධිරාජ්‍යවාදයට එරෙහිව අද සටන් වදින්නේ ජාතිකත්වය මත පදනම් වූ පක්ෂ මිස ඊනියා කම්කරු පංතියක් මත පදනම් වූ පක්ෂ නො වෙයි. කියුබාවේ හා වෙනිසියුලාවේ ද අනෙක් රටවල ද තත්වය එයම ය. මාක්ස් මොන බයිලා කියා තිබුණත් ඇමරිකාවේ හා යුරෝපයේ ඊනියා කම්කරු පංතිය බුෂ්ට විරුද්ධව නො යයි. මෙහි බුෂ්ට විරුද්ධව යන්නෙහි තේරුම ඔහුගේ ප්‍රතිපත්තිවලට විරුද්ධව ය යන්න නොතේරේ නම් ඒ කසිකබල් මාක්ස්වාදියකුට පමණ ය.

ලංකාවේ ඊනියා කම්කරු පංතියක් බෙහෙතකටවත් සොයා ගැනිමට නොහැකි නමුත් රතු කමිස ඇඟලා ගත් කම්කළු නායකයන් යැයි කියා ගන්නා අය වෙති. නැති කම්කරු පංතියකට නායකත්වය දීම එසේ මෙසේ කාර්යයක් විය නො හැකි ය. ඒ කෙසේ වෙතත් මේ නායකයන්ට ජාතිය යන්න නයාට අඳු කොළ මෙනි. ඔවුහු සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයනට වෛර කරති. උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීම නිසා සිදුවන්නේ මුස්ලිම් ජනයා දෙමළ ආධිපත්‍යයක් යටතට පත් කිරීම ය. බොහෝ මුස්ලිම් පක්ෂ එවැන්නකට විරුද්ධ ය. උතුරු හා නැගෙනහිර පළාත් එක් කිරීමෙන් පසුව වෙන ම මුස්ලිම් කලාපය පිහිටුවිය යුත්තේ කෙසේ ද? අනෙක් අතට ඊනියා මුස්ලිම් කලාපය වෙන ම කලාපයක් වුවත් ඒ උතුරු හා නැගෙනහිර පළාතේ ආධිපත්‍යට යටත්වනු ඇත. කොංග්‍රස් සාමාජිකයන් නොවන මුස්ලිම් ජනයා සිදුවන්නේ කුමක් දැයි දන්නේ නම් වෙන ම පළාත් සභාවල හෝ උතුරු හා නැගෙනහිර ඒකාබද්ධ පළාත් සභාවක හෝ දෙමළ ආධිපත්‍යයක් යටතේ ජීවත්වීමට අකමැති වෙති.

අද අම්පාර දිස්ත්‍රික්කයේ හා නැගෙනහිර පළාතේ එයට ආසන්න ප්‍රදේශවල ජීවත්වන මුස්ලිම් ජනයා උතුරු හා නැගෙනහිර පළාත්වල ඒකාබද්ධ පළාත් සභාවක ආධිපත්‍යය යටතට ගෙන ඒමට කටයුතු කරන්නේ මුස්ලිම් කොංග්‍රසය ය. එමෙන් ම උතුරු හා නැගෙනහිර පළාත් එකතුකරන විසඳුමකට බටහිරයෝ ද අනුග්‍රහය දක්වති. ඒ සඳහා කොටි සංවිධානය මෙන් ම ඔවුන්ගේ පාර්ලිමේන්තු නියෝජිතයා වූ දෙමළ ජාතික සංධානය ද පක්ෂ වෙයි. එයට අමතර ව එක්සත් ජාතික පක්ෂය ද අවසානයේ දී උතුරු හා නැගෙනහිර පළාත් එක්කිරීම වෙනුවෙන් පෙනී සිටියි. බටහිරයන්ට අවශ්‍ය ඊනියා විසඳුමකට අවසානයේ දී එ ජා ප එකඟ වෙයි.

කොටි සංවිධානය හැරෙන්නට උතුරු පළාත පදනම්කරගත් අනෙක් දෙමළ පක්ෂවලට ද උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීමට අවශ්‍ය වෙයි. උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීමට විරුද්ධ එක ම දෙමළ දේශපාලන පක්ෂය

© Prof. Nalin De Silva

පිල්ලයාන්ගේ පක්‍ෂය වෙයි. එයට හේතුව ඒ පක්‍ෂය උතුර පදනම්කරගත් පක්‍ෂයක් නො වීම ය. ඒ පක්‍ෂය නැගෙනහිර පළාත, නිවැරදිව කිවහොත් මඩකලපු දිස්ත්‍රික්කය පදනම් කරගත් පක්‍ෂයකි. ඔවුහු උතුරු පළාතේ ආධිපත්‍යය පිළිගැනීම ප්‍රතික්‍ෂෙපකරති.

මෙවර නැගෙනහිර පළාත් සභා මැතිවරණයේ දී උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීම ද වැදගත් මාතෘකාවක් වනු ඇත. මුස්ලිම් කොංග්‍රස් හා එ ජා ප සංධානය උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීමටත් එහි වෙන ම මුස්ලිම් කලාපයක් ඇතිකිරීමටත් පක්‍ෂව තම මැතිවරණ ව්‍යාපාරය කරගෙන යනු ඇත. එයට  දෙමළ ජාතික සංධානයේ, එනම් කොටි සංවිධානයේ කැමැත්ත ලැබෙනු ඇත. මේ පක්‍ෂ අද ක්‍රියාකරන්නේ බටහිරයන්ගේ න්‍යාය පත්‍රයට අවශ්‍ය වන ආකාරයට ය.

උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධකර එහි වෙන ම මුස්ලිම් කලාපයක් පිහිටුවීමට සමහරවිට මුස්ලිම් ඡන්දදායකයන් කැමති වනු ඇත. ඒ ඉන් තමන්ට සිදුවන හානිය ගැන කිසිම අවබෝධයක් නැතිව ය. කිනම් අයුරකින් පිහිටුවුව ද මුස්ලිම් කලාපය උතුරු හා නැගෙනහිර ඒකාබද්ධ පළාත් සභාවේ ආධිපත්‍යය යටතට පත්වෙයි. එමගින් නැගෙනහිර පළාතේ මුස්ලිම් බලයක් ඇත්නම් ඒ නැති වී යයි. නැගෙනහිර පළාතෙන් නෛතික ව වෙන්කෙරී පිහිටුවන එවැනි කලාපයක් පැහැදිලිව ම ජනවාර්ගික බලය බෙදීමක් වෙයි. නැගෙනහිර පළාතෙන් මුස්ලිම් කලාපයක් වෙන්කර උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධකර පිහිටුවන පළාත් සභාවක අති විශාල බහුතරය දෙමළ වනු ඇත.

යම්කිසි පළාත් සභාවක යම් ජනවර්ගයක් දැනටමත් බහුතරය වීම ප්‍රශ්නයක් නො වෙයි. එහෙත් ප්‍රශ්නය වන්නේ යම් යම් ජනවර්ග බහුතරය බවට පත්කිරීමේ අවශ්‍යතාව මත පදනම් ව පළාත් එකතුකිරීම, කලාප වෙන්කිරීම ආදිය ය. ඒ පැහැදිලිව ම ජනවාර්ගික බලය බෙදීමක් සඳහා පදනම සකස්කිරීමකි. ඒකීය රාජ්‍යයක් තුළ හෝ ජනවාර්ගික බලය බෙදීමක් අවසානයේ දී වෙන ම රාජ්‍යයක් පිහිටුවීමට මග පාදනු ඇත.

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් එකතු නො කෙරිණි. ඒ ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා එකතුකිරීමක් කළ හැක්කේ පාර්ලිමේන්තුවට ය. ජේ ආර් ජයවර්ධන මහතා ජනාධිපති ලෙස උතුරු හා නැගෙනහිර පළාත් එකතුකෙළේ හදිසි නීති රෙගුලාසි උපයෝගීකරමිනි. උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ ඊනියා සාම්ප්‍රදායික වාසභූමි ලෙස පිළිගනු ලැබුයේ ඉන්දු ලංකා ගිවිසුමෙනි. ඊළමෙහි පදනම ඇත්තේ මේ වාසභූමි සංකල්පය හා ජනවාර්ගික බලය බෙදීම ය.

නැගෙනහිර පළාත් සභා ඡන්දයේ දී මේ ජනවාර්ගික බලය බෙදීම සඳහා කෙරෙන උත්සාහය පරාජය කළයුතු වෙයි. ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට දිය යුතු විසඳුම් කිසිසේත් ම ජනවාර්ගික නොවිය යුතු ය. ජනවාර්ගික විසඳුම් මගින් ජනවාර්ගික බෙදීමකට රට තල්ලුකෙරෙනු ඇත. ඇතැම් අද බාලයන්ට නොතේරුණ ද මෙරට දෙමළ ජාතිවාදයක් ඇත. දෙමළ ජාතිවාදීන් උත්සාහ ගන්නේ මෙරට සිංහලත්වයට හිමි තැන අහිමිකිරීම ය. අපට පරාජයකිරීමට සිදු වී ඇත්තේ දෙමළ ජාතිවාදය ය.

දෙමළ ජාතිවාදය පරාජයකිරීමේ කේන්ද්‍රස්ථානය නැගෙනහිර පළාත වෙයි. එහි දී ඒ පළාත උරගල වෙයි. නැගෙනහිර පළාතේ දළ වශයෙන් සිංහල දෙමළ මුස්ලිම් සම ජන සංයුතියක් වෙයි. නැගෙනහිර පළාත උතුරු පළාතට එකතුකිරීමට හෝ ඉන් කලාපයක් ඉවත්කිරීමට හෝ කිසිම ඉඩක් නොදිය යුතු ය. එසේ කළහොත් අද ජනවාර්ගික බෙදීමක් නැති නැගෙනහිර පළාත ජනවාර්ගික පළාත් හා කලාපවලට බෙදෙනු ඇත.

අද එ ජා ප, මුස්ලිම් කොංග්‍රස් සංධානයට අවශ්‍ය වන්නේ බටහිරයන්ගේ අරමුණ ඉටුකරමින් නැගෙනහිර පළාත ජනවාර්ගික කලාපවලට කැඩීම ය. එයට කොටි සංවිධානයේ හා ඔවුන්ගේ පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සහාය ලැබෙයි. ඒ සඳහා තවත් පැත්තකින් සහායක් නැගෙනහිර පළාත් සභා ඡන්දය වෙනුවෙන් එක් වී ඇති සමසමාජ කොමියුනිස්ට් සහ වාමාංශික යැයි කියන දෙමළ පක්‍ෂවලින් ලැබෙයි. නැගෙනහිර දී මේ සියල්ලන් පරාජය කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva